**<u>කුලී පදනම මත යන්ත්‍රෝපකරණ සහ බරවාහන සැපයුම්කරුවන් සඳහා උපදෙස් පත්‍රිකාව</u>**

**වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**
**පරිසර අමාත්‍යාංශය**

1. වෙරළ ආරක්ෂණ ව්‍යුහ ඉදිකිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට 2026 වර්ෂය සඳහා යන්ත්‍ර / බර වාහන කුලී පදනම මත සැපයීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදංචි වීමට කැමති යන්ත්‍රෝපකරණ සහ බරවාහන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට පූර්ව සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ආරාධනය කරනු ලැබේ.

2. වෙරළ සංරක්ෂණ වැඩබිම් වලට අවශ්‍ය පහත සඳහන් යන්ත්‍ර හා බර වාහන කුලී පදනම මත සැපයීම සඳහා ලියාපදංචි කිරීමට 2025. 12. 15 වන දින සිට 2025. 12. 31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

| කුලී පදනම මත දෙපාර්තමේන්තුවට අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ සහ බරවාහන |
|---|
| ටොන් 03 සිට ටොන් 07 බර පරිමාණයේ එක්ස්කැවේටර් යන්ත්‍ර |
| ටොන් 12 සිට ටොන් 30 බර පරිමාණයේ එක්ස්කැවේටර් යන්ත්‍ර |
| කියුබ් (0.5 – 1.0) බකට් ධාරිතාවයේ වීල් ලෝඩර් යන්ත්‍ර |
| බකට් ධාරිතාව කියුබ් 1, 2, 3 හා 5 වන ටිපර් රථ |
| ටොන් 15 හෝ ඉහළ බර ප්‍රමාණයේ 4-wheel drive ඩම්ප් ට්‍රක් රථ |
| බැකෝ ලෝඩර් යන්ත්‍ර (0.75-1.0)$m^3$ |
| යන්ත්‍ර ප්‍රවාහනය සඳහා උස තට්ටුව ට්‍රේලර් / පහළ තට්ටුව ට්‍රේලර් |

ඉහත සඳහන් යන්ත්‍ර හා බර වාහන අවශ්‍ය ප්‍රමාණයන් හා ඒ හා සම්බන්ධ පිරිවිතර එක් එක් ව්‍යාපෘතියේ අවශ්‍යතාවය පරිදි දැනුම් දෙනු ලැබේ.

3. ලියාපදිංචි වීමට අපේක්ෂා කරන සැපයුම්කරුවන් විසින් තම ආයතනයේ නම සඳහන් ලිපි ශීර්ෂයක් සහිත ලිපියක් මඟින් අයදුම්පත ඉදිරිපත් කල යුතුවේ. ආපසු ගෙවනු නොලබන රු. 4,000.00 ක ගාස්තුවක් මුදලින් හෝ **"අධ්‍යක්ෂ ජනරාල් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ" ගිණුම් අංක 07042641** නමට කරන ලද බැංකු තැන්පතුවක් මඟින් ගෙවිය යුතු වන අතර, එම අයදුම්පත සමග මුදල් ගෙවුම් ලදුපත/ බැංකු රිසිට්පත හි පිටපතක් ද ඉදිරිපත් කල යුතුය. ලියාපදිංචි ගාස්තුව මුදලින් ගෙවන්නේනම් රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව.3.00 දක්වා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවිය හැක.

4. අයදුම්පත්, ලිපිකවරයේ වම් පස ඉහළ කෙලවරේ **"2026 වර්ෂය සඳහා වෙරළ ආරක්ෂණ ව්‍යුහ ඉදිකිරීම සඳහා යන්ත්‍ර හා බර වාහන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් පැහැදිලිව

සටහන් කර පහත සඳහන් ලිපිනයට **2026.01.01** දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ කළ යුතුය.

ලිපිනය : අධ්‍යක්ෂ ජනරාල්,
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
නව මහලේකම් කාර්යාලය, 4වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.

5. අයදුම්පත් පහත සඳහන් ස්ථානයන්හිදි ලබා ගත හැක.
   - නව මහ ලේකම් කායාීලය, මාලිගාවත්ත, කොළඹ 10 පිහිටි වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කයාීලයේ වෙරළ සංවර්ධන අංශයෙන්.
   - මීගමුව, මොරටුමෝදර, ගාල්ල, මාතර, ත්‍රිකුණාමලය, මඩකලපුව, යාපනය, සහ අම්පාර පිහිටි වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල වලදී
   - දෙපාර්තමේන්තු වෙබ් අඩවිය www.coastal.gov.lk

6. පහත ලැයිස්තුවේ සඳහන් ලිපිලේඛන අයදුම් පත සමඟ ඉදිරිපත් කල යුතු අතර, එම පිටපත් නීතීඥයෙකු විසින් සහතික කල යුතුය.

| **යන්ත්‍රෝපකරණ සහ බරවාහන සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කළයුතු ලිපි ලේඛන** |
|---|
| ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් |
| අයදුම්කරු සතු හා කුලී/බදු පදනම මත ලබාගත් යන්ත්‍රෝපකරණ වල සහතික කළ ලැයිස්තුවක් (ටිපර්, ලෝඩර්, එක්ස්කැවේටර්, හයිබෙඩ්/ ලෝබෙඩ් ට්‍රේලර්, ඩම්ප් ට්‍රක් රථ) |
| අයදුම්කරුට යන්ත්‍රෝපකරණ සහ බර වාහන වල හිමිකම නැති නම්, යන්ත්‍රෝපකරණ සහ බර වාහනවල හිමිකරුවන් සහ අයදුම්කරු අතර ඇති කර ගත් ගිවිසුම් වල පිටපත් |
| පසුගිය වසර දෙක (02) තුළ මෙම දෙපාර්තමේන්තුව හෝ වෙනත් ආයතන වලට කුලී පදනම මත සිදු කල යන්ත්‍ර හා බර වාහන සැපයුම් පිළිබඳ තොරතුරු ලැයිස්තුවක් |
| VAT බදු ලියාපදිංචි සහතිකයේ පිටපතක් (ලියාපදිංචි වී ඇත්නම් පමණි) |

7. මෙම යන්ත්‍ර හා බර වාහන සැපයුම් කොළඹ, ගම්පහ, පුත්තලම, මන්නාරම, යාපනය, කිලිනොච්චි, මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, හම්බන්තොට, මාතර, ගාල්ල සහ කළුතර යන වෙරළබඩ දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය වනු ඇත. අයදුම්කරුවන්ට සැපයීමේ තම හැකියාව අනුව දිස්ත්‍රික්ක සියල්ලටම හෝ කීපයකට පමණක් හෝ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ හැක.

8. මෙම වර්ෂය (2025) තුළ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සැපයුම්කරුවන් 2026 වර්ෂය සඳහාද නැවත අයදුම් කළ යුතුය.

9. මූලික සුදුසුකම් සපුරන අයදුම්කරුවන් දෙපාර්තමේන්තුව විසින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ දිනය ඔබ වෙත ලිපියක් මගින් දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

**10.** අයදුම්පත් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දෙපාර්තමේන්තුව සතුය. සියලු පැහැදිලි කර ගැනීම් සහ විමසීම් පහත ලිපිනය වෙතින් ලබා ගත හැකිය.


ප්‍රධාන ඉංජිනේරු (වෙරළ සංවර්ධන)
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
නව මහලේකම් කාර්යාලය, 4වන මහල,
මාලිගාවත්ත, කොළඹ 10.
දුරකථන: 011-2472622 / විද්‍යුත් තැපැල : coastaldevelopmentcd@gmail.com